2019.08.29

වන්දන වික්‍රමරත්න මහතා
වැඩ බලන පොලිස්පති
පොලිස් මූලස්ථානය
කොළඹ 01

**2007 අංක 56 දරණ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියෙහි 3 වන වගන්තියෙහි අන්තර්ගතය පිළිබඳව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නීතිමය විශ්ලේෂණය සහ ඒ හා සමගාමික නිර්දේශයන්**

2007 අංක 56 දරණ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියෙහි (ICCPR පනත) 3 වන වගන්තියෙහි අන්තර්ගතය පිළිබඳව නීතිමය විශ්ලේෂණය සහ එහි භාවිතය පිළිබඳව මෙම කොමිෂන් සභාවේ නිර්දේශ මෙයින් ඉදිරිපත් කර සිටිමු.

මෙම කොමිෂන් සභාව ICCPR පනතෙහි 3 වන වගන්තිය වෛරී ප්‍රකාශන මැඩ පැවැත්වීම සඳහා යොදා ගත හැකි වැදගත් නීතිමය මාධ්‍යයක් ලෙස සලකයි. අප දන්නා පරිදි අවාසනාවට වෛරී ප්‍රකාශන මෙම රටෙහි නොයෙකුත් කණ්ඩායම් ඉලක්ක කරගත් පොදු සංසිද්ධියක් බවට පත් වී ඇත.

එහෙත් ICCPR පනතෙහි 3 වන වගන්තිය එක හා සමාන ලෙස, ඒකාකාරීව ක්‍රියාවට නංවා නොමැති බව මෙම කොමිෂන් සභාව නිරීක්ෂණය කරන අතර එම වගන්තියෙහි ඇතුලත් අපාරාධයන්හී අන්තර්ගතය පිළිබඳව ප්‍රබල පැහැදිලි කිරීමක අවශ්‍යතාවය පවතින බව නිරීක්ෂණය කරයි.

ICCPR පනතෙහි 3 වන වගන්තිය සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියෙහි 20 වන වගන්තියට අනුකූල වේ. එබැවින්, මේ සමඟ එවා ඇති නීතිමය විශ්ලේෂණය සහ නිර්දේශයන් එම සම්මුතියෙහි 20 වන වගන්තිය හා සබැඳි ජාත්‍යන්තර නීති රාමුව පිළිබඳ කොමිෂන් සභාවේ අධ්‍යයනයන්හී ප්‍රතිඵලයක් වේ.

මෙම නීතිමය විශ්ලේෂණය සහ නිර්දේශයන් මූලික අයිතිවාසිකම් පිළිබඳ ක්ෂේත්‍රයෙහි නීති වෘත්තිකයන්ගේ උපදේශනය ලබා ගැනීමෙන් අනතුරුව සම්පාදනය කරන ලදී.

ICCPR පනතෙහි 3 වන වගන්තිය සාධාරණව සහ ඵලදායීව බලාත්මක කිරීම සඳහා පොලිස් දෙපාර්තමේන්තුව විසින් මෙම මාර්ගෝපදේශයන් සැලකිල්ලට ගන්නා ලෙස මෙම කොමිෂන් සභාව මෙයින් නිර්දේශ කර සිටිමු. මේ හා සම්බන්ධව අවශ්‍ය පැහැදිලි කිරීම් වෙතොත් එය සැපයීමට අප සතුටු වෙමු.

ස්තුතියි.

සභාපතිනී
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

ඇතුළත්: 2007 අංක 56 දරණ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියෙහි 3 වන වගන්තියෙහි අන්තර්ගතය පිළිබඳව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නීතිමය විශ්ලේෂණය සහ ඒ හා සමගාමික නිර්දේශයන්